


# සමගිය බලය වේ

රැහිනි විසාක්‍යා ජයකොඩි

# සමගිය බලය වේ

## රුහිනි විසාක්යා ජයකොඩි

කතෘ

කතෘගේ වෙනත් කෘති:

2020-The Princess and the Fig

2021-My Poem Book

2022-පැංචිගේ සිහිනය

පාසල- මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

ශ්‍රේණිය- 10 ශ්‍රේණිය G

කෘතිය පළකරන දිනය- 2025.02.08

ISBN - 978-624-208-890-7

# පිදුම

මා ඇති දැඩි කළ මාගේ ආදරණීය
දෙමාපියන්ටත්, මා හට ශිල්ප ශාස්ත්‍ර
ඉගැන්වූ මා දයාබර ගුරුවරුන්ටත් මෙම
කෘතිය පුද කරමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත් සමත් වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදෙන අත්තදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළිගොඩ නගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පුංචා හා පැංචා

ඔන්න එකෝමත් එක රටක ලස්සනම ලස්සන පුංචි කැලයක් තිබුණා ඒ කැලේ ලස්සන පුංචි හා පැටියෙක් ජීවත් වුණා. මේ හා පුංචා හරිම කීකරුයි ඒ වගේම හරි හොඳයි. මේ හා පුංචා විතරක් නෙවෙයි, තව ගොඩක් සත්තු මේ කැලේ ජීවත් වෙනවා. මේ සත්තු අතර පුංචි වඳුරු පැංචෙක් ජීවත් වුණා. මේ වඳුරු පැංචා හිතන් ඉන්නේ එයා තරම් බුද්ධිමත් කෙනෙක් වෙන කොහෙවත් නෑ කියලා. එහෙම මෙයා හිතාගෙන ඉන්නේ මෙයා ගොඩක් වංශවත් පවුලක කෙනෙක් නිසා.

ඔන්න දවසක් හා පුංචාගේ අම්මා හා පුංචාව කොටි ඇදුරුතුමා ගාවට යැව්වා ඉගෙන ගන්න. මේ කොටි ඇදුරුතුමා තරම් හොඳ ගුරුවරයෙක් මේ මුළු කැලෙන්වත් හොයා ගන්න නැති තරම් මේ ඇදුරුතුමා දක්ෂ

ගුරුවරයෙක්. මේ කැලේ ඉන්න වඳුරු පැංචාගේ තාත්තාට මේක දැනගන්න ලැබුණා. ඉතින් මේ වඳුරු තාත්තා වඳුරු පැංචාට මෙහෙම කිව්වා.

"පුතේ ඔයාට දැන් ඉගෙන ගන්න කාලෙ ඇවිත්. මම මේ කැලෑවේ ඉන්න දක්ෂම ගුරුතුමාව ඔයාගේ ඇදුරුතුමා කරනවා."

හැබැයි මේ වඳුරු පැංචා ඒකට කැමති වුණේ නෑ. මෙයා මෙයාගේ තාත්තට මෙහෙම කියනවා,

"අනේ තාත්තේ, මම කොච්චර බුද්ධිමත් ද ඒ වගේම කොච්චර දක්ෂ ද ඇයි මට ගුරුවරු?"

වඳුරු තාත්තා කිව්වා, "ඔයා ඒ ගුරුතුමා ගාවට යන්නම ඕනෙ. ගියේ නැත්නම් මම ඔයාව ගෙදරට ගන්නේ නෑ."

"හරි, හරි, මම යන්නම් කෝ". කියලා පුතා කිව්වා

# පැංචාගේ පාසලේ පළමු දවස

යන්තමින් එළිය වැටීගෙන එනකොටම හා පුංචා වෙනදාටත් වඩා සතුටින් හා ප්‍රබෝධයෙන් නැගිටලා හොඳට මූණ හෝදගෙන අම්මා ළඟට ගියා. ඉතින් අම්මා ඇහුවා, "පුංචෝ ඔයා වෙනදාට වඩා සතුටින් වගේ, මොකක්ද හේතුව?" පුංචා කිව්වා, "මේකනේ, අද කොටි ඇදුරුතුමා අපිට මිනිස් උගුල්වලින් බේරෙන හැටි කියලා දෙනවා කීවා." "ඒකනම් හොදයි. එහෙනම් මේ උඳුපියලිය ටිකත් කාලම යන්නකෝ." පුංචාගේ අම්මා කිව්වා. "හරි එහෙනම් මම යනවා." පුංචා කිව්වා.

මේ අතරේ වඳුරු තාත්තා මෙහෙම කියනවා. "බලන්නකෝ මේ ළමයා තාම නිදි. නැගිටිනවා.... නැගිටිනවා.... බලන්න දැන් වෙලාව කීයද කියලා.... පාසල් යන පළවෙනි දවසෙම කොටි අදුරුතුමාගෙන් බැනුම්

අහන්නද ඕනේ? නැගිටින්න.... නැගිටින්න...." "අයියෝ තාත්තේ, මට තව නිදාගන්න දෙන්නකෝ. තාම උදේ හතයි නේ" කියලා වඳුරු පැංචා කිව්වා. "ඉන්න මම පොල්ලක් අරන් එන්න" කියලා වඳුරු තාත්තා කියනකොටම වඳුරු පැංචා මෙහෙම කියනවා. "මො....මොකටද පොල්ලක්? මම මේ ඇහැරිලානේ ඉන්නේ. ඉන්න මම ඉක්මනට ඇඳගෙන එන්නම්" කියලා වඳුරු පැංචා පාසලට යන්න ලෑස්ති වුණා.

ඉතින් මේ වඳුරු තාත්තා, "පුතේ මෙන්න මේ කෙසෙල් ගෙඩි ටික කන්නකෝ. ඔයා මේවට කැමතියි නේද?" කියලා කිව්වා. "ඔව් ඔව් මම මේවට ගොඩක් කැමතියි." කියලා වඳුරු පැංචා ඒ ඔක්කොම ටික කෑවා. "දැන් අපි පාසලට යමු." කියලා වඳුරු තාත්තා කිව්වා. ඉතින් මේ වඳුරු තාත්තයි වඳුරු පැංචයි පාසලට යන්න පිටත් වුණා.

"හරි ළමයිනේ අද මම ඔගොල්ලන්ට මිනිස් උගුල්වලින් බේරෙන හැටි කියලා දෙනවා කිව්වනේ, ඊට කලින් අපේ පාසලට එන අලුත් යාළුවව අපි හඳුන ගනිමු. මෙයා තමයි වඳුරු පැංචා. ඔගොල්ලෝ එහෙනම් ටිකක් අඳුර ගන්නකෝ. මම පොඩ්ඩක් ගිහිල්ලා අද පුහුණුවට අවශ්‍ය බඩු ටික ගේන්නම්." කියලා කොටි ඇදුරුතුමා කිව්වා.

"ආ ඔයාට කොහොමද? සාදරයෙන් පිළිගන්නවා අපේ පාසලට" කියලා හා පුංචා කිව්වා. ඉතින් මේ වඳුරු පැංචා කියනවා, "මට කොහොම වුණත් ඔයාට මොකද? මට මේ පාසලට එන්න ඕන උනේ නෑ. මම මේ හැමෝටම වඩා බුද්ධිමත්. අනික ඔයා කවුද මාව මෙතනට පිළිගන්න?" " මගේ නම පුංචා. ඇයි ඔයාට ඔච්චර තරහ යන්නේ?" කියලා හා පුංචා ඇහුවා. "මට තරහ ගියාට ඔයාට මොකද?"

"හා.. හා.. ළමයිනේ රණ්ඩු කරන්න එපා. රණ්ඩු කරන්න ඕනෙනම් වෙන තැනකට

යන්න." කියලා කොටි ඇදුරුතුමා කිව්වා. "ඔන්න හරි. අපි දැන් කැලේට යමු."

ඔන්න මේ කොටි ඇදුරුතුමයි, ශිෂ්‍යයෝයි කැලේ මැද්දටම ගියා.

"හරි ළමයිනේ, මම දැන් ඔයාලට කියලා දෙනවා කොහොමද උගුල්වලින් බේරෙන්නේ කියලා.

"අනේ ගුරුතුමනි, ඒක කොච්චර හොඳද. මම අද උදේ ඉඳන් ගොඩක් ආසාවෙන් හිටියේ මේ වෙලාව එනකන්." කියලා හා පුංචා කිව්වා.

ඉතින් වඳුරු පැංචා හිතනවා, "අප්පෝ ඕවා මම දන්නවනේ. ඔය මිනිස්සු අටවන උගුල්වලින් බේරෙන එක හරියට කජු කනවා වගේ වැඩක්. මම මේ කාටත් පේන්නේ නැතිව ගිහිල්ලා ගහක් යටට වෙලා නිදාගන්නවා.

ඒක තමයි හොඳ." මේ වඳුරු පැංචා කාටවත් පේන්නේ නැතුව එතනින් ගියා.

"අපි මේ වගේ උගුලකට අහුවුණොත් හරියට මැරිලා වගේ ඉන්න ඕනේ. එහෙම හිටියම අපිට ඒ දඩයක්කාරයාව රවට්ටන්න පුළුවන්. දැන් මම ඔගොල්ලොන්ට පෙන්නන්නම් මැරිලා වගේ ඉන්නේ කොහොමද කියලා." කොටි ඇදුරුතුමා කියලා දුන්නා.

ඉතින් මේ හැමෝම පාසල ඉවර වෙලා ගෙදර යන්න පිටත් වුණා.

මේ අතරේ වඳුරු පැංචා නින්දෙන් නැගිටලා මෙහෙම කියනවා, "හා.... හා.... හා.... දැන්නම් මට ගෙදර යන්න වෙලාව හරි වගේ. ඊට කලින් මම මොනවා හරි කාලා ගියා නම් හරි. ආ.... අන්න කෙසෙල් ගහක්. වැඩක් නෑ. මට කෙසෙල් කන්න නම් ඉතින් ගහට නගින්න

එපැයි. මොනවා හරි බිම තියෙන දෙයක් හොයාගන්න ඕනේ."

මෙහෙම කිය කියා ඇවිදිනකොට මේ වඳුරු පැංචා කෙසෙල් ගෙඩියක් බිම තියෙනවා දැක්කා.

"අන්න බිම කෙසෙල් ගෙඩියක්. කවුරු හරි ගන්න කලින් මම ඒක කන්න ඕනේ."

ඉතින් මේ වඳුරු පැංචා ඒක කොහොමද එතනට ආවේ, එතන උගුලක් තියෙනවද, ඒ මොනවත් හිතන්නේ බලන්නේ නැතුව කෙසෙල් ගෙඩිය කන්න පටන් ගත්තා. අනේ මේ වඳුරු පැංචා එතන අටවලා තිබුණු උගුලට හසු වුණා.

"අනේ දැන් මං මොකද කරන්නේ? මම මේ උගුලට අහු උනානේ. අපරාදේ මට ගුරුතුමා අද කියලා දීපු එක අහගන්නයි තිබුණේ. මගේ

මෝඩකමනේ. මම දැන්......." කිය කියා වඳුරු පැංචා හිතන්න පටන් ගත්තා. ඒත් එයාට කිසිම දෙයක් ඔළුවට ආවේ නෑ.

ඉතින් මේ වඳුරු පැංචා හයියෙන් කෑ ගහන්න පටන් ගත්තා. "අනේ මාව බේරගන්න...... අනේ මාව බේරගන්න...."

එතකොට ඒ ළඟින් ගියපු හා පුංචාට මේ වඳුරු පැංචා විලාප දෙන සද්දේ ඇහුණා.



"කවුද ඒ විලාප දෙනවා ඇහෙන්නේ? මේ පැත්තෙන් තමයි ඇහෙන්නෙ නම්. ම්...... ගිහිල්ලම බලමු." කියලා හා පුංචා කැලෑව ඇතුළට ගියා.

"ආ..... මේ වඳුරු පැංචා නේද? වඳුරු පැංචෝ, ඔයාට මේ මොකද්ද සිද්ධ වුණේ?"

"මට මොනව උනත් ඔයාට මොකද?"

"ආ..... මම මේ බැලුවේ ඔයාට උදව් කරන්න. ඕනෙ නැත්නම් මම යනවා. ඔයා ඔය උගුලෙන් හෙමිහිට බේරිලා යන්නකෝ. එහෙනම් හෙට පාසලේදී හමුවෙමු." කියලා හා පුංචා විහිළුවට කිව්වා." පොඩ්ඩක් ඉන්න. මට සමාවෙන්න මම ඔයාට කිව්ව දේවල්වලට. මට මෙතනින් බේරෙන්න උදව් කරන්න පුළුවන්ද?"

"ඉතින් ඔයා අද ගුරුතුමා පාසලේදී  කියලා දුන්න විදිහට කරන්නකෝ."

"ඒත්... මේ...මේ..ම..ම..මේ.....මම"

"ඇයි මේ මම මම කියන්නේ?"

"මොකද මේ.... අද ගුරුතුමා ඒක කියලා දෙද්දී මම කාටත් නොදැනෙන විදිහට එතනින් ඇවිල්ලා නිදාගෙන හිටියා. මේ.... ඊට පස්සේ තමයි මම මේ උගුලට අහු උනේ."

"හරි, හරි, අපි ඒක ගැන පස්සෙ කතා කරමු. මම දැන් කියන විදිහට ඔයා ඉන්න ඕනෙ හරිද... ඔයා මැරිලා වගේ ඉන්න. එතකොට ඔයාට ඔතනින් පැනගන්න පුළුවන්."

ඊට පස්සේ වඳුරු පැංචා ඒ කිව්ව විදිහටම හිටියා. ටික වෙලාවකට පස්සේ දඩයක්කාරයා එතනට ආවා.

ඒ දඩයක්කාරයා වඳුරු පැංචාව මැරිලා කියලා හිතලා එයාව ලිහලා එයාව පුච්චන්න හොඳ ගිනි ගොඩක් ගහන්න පටන් ගත්තා. ඒ අතරේ,

"පැංචෝ, ඉක්මනට ඔතනින් පැනගන්න. එයා වෙන පැත්තක් බලාගෙන ඉන්නේ." කියලා පුංචා කිව්වා. එතකොටම පැංචා එතනින් පැන ගත්තා.

"අනේ, ඔයාට කොහොම ස්තූති කරන්නද මන්දා. ඔයා නැත්නම් මෙලහකට මම මැරිලා. ඔයාට ගොඩක් ස්තූතියි."

"ඕක මොකක්ද. ඔයකට ඔච්චර ස්තූති කරන්න ඕනේ නෑ. දැන් අපි ගුරුතුමා ගාවට යමු." ඉතින් මේ දෙන්නා පාසලට ගියා.

"ඇයි ඔයා මෙච්චර පරක්කු වුණේ? මොනවත් ප්‍රශ්නයක් නැනේ?" කියලා වඳුරු තාත්තා කලබලෙන් ඇහුවා.

"ගුරුතුමනි, අපි මේ පරක්කු වුණේ මේකයි... වඳුරු පැංචා උගුලකට අහුවෙලා හිටියේ. එයා එතනින් අද ඔබතුමා කියලා දුන්න විදිහටම කරලා බේරෙනවා මම හැංගිලා බලන් හිටියා."

"ආ....කොච්චර හොඳද? ඔයා අපූරුවට වැඩේ කරලා තියෙනවා." ගුරුතුමා වඳුරු පැංචාට කිව්වා.

"ස්තූතියි ගුරුතුමනි."

පුංචෝ, ඇයි ඔයා මාව එහෙම බේරගත්තේ? ඔයාට තිබුණානේ මම ඒ කරපු දේ ගැන කියන්න."

"එහෙම තමයි හොඳ යාළුවෝ."

එදා ඉඳන් වඳුරු පැංචා කවමදාකවත් උඩඟු වුණේ නෑ.

# තවත් අළුත් යාළුවෙක්

ඔන්න තවත් දවසක මේ ගුරුතුමා ගැන අහලා තවත් සිසුවෙක් මේ පාසලට ඇතුළු වුණා. මේ අලුත් යාළුවාගේ නම තමයි නරි පොඩ්ඩා. මේ නරි පොඩ්ඩා හරිම කපටියෙක්. ඒ වගේම හරිම හිතුවක්කාරයි. වෙනදා වගේම හා පුංචා උදේම නැගිටලා පාසලට ආවා. වඳුරු පැංචාත් දැන් ආසාවෙන් පාසල් යනවා. ඉතින් මේ ගුරුතුමා මෙහෙම කියනවා. "ළමයිනේ නිශ්ශබ්ද වන්න. මේ ඉන්නේ අපේ පාසලට එන අලුත්ම සිසුවා. මෙයාගේ නම නරි පොඩ්ඩා."

"ආ.....කොහොමද නරි පොඩ්ඩෝ." පැංචයි පුංචයි ඇහුවා.

"මම නම් හොඳින් ඉන්නවා. ඔයාලට කොහොමද?" "අපිත් හොඳින්."

හා පුංචා හිතනවා, "මෙයා නම් හොඳ කෙනෙක් වගේ. ඒ නිසා බයවෙන්න ඕනෙ නෑ." සුපුරුදු පරිදි ගුරුතුමා සිසුන්ට ඉගැන්නුවා. "එහෙනම් ළමයිනේ පාසල අදට ඉවරයි." ඉතින් හැමෝම ගෙදර ගියා.

ඊළඟ දවසේ හැමෝම වෙනදා වගේම පාසලට ආවා. "මේ මොකද... කෝ මෙතන තිබුන මගේ නිර්මාණ ටික? මොකද්ද මේ වෙලා තියෙන්නේ? අනේ කෝ මගේ පොත් ටික?" මේ වගේ හැමෝගෙම බඩු නැති වෙලා. "ළමයිනේ මොකද කලබලේ?" "ගුරුතුමනි, අපේ බඩු නැති වෙලා." සිසුන් හැමෝම කියනවා. "එහෙම වෙන්නේ කොහොමද? මම දැන්ම ඒ ගැන හොයලා බලන්නම්." කියලා ගුරුතුමා කිව්වා. "මොකද්ද මේ එක පාරටම සිද්ධ වෙලා තියෙන්නේ?" හා පුංචා වඳුරු පැංචාගෙන් ඇහුවා. "මටත් හිතාගන්න බෑ." ඔන්න ඔහොම දවසින් දවස මේ සිසුන්ගේ බඩු නැතිවෙන්න ගත්තා. මේ හා පුංචයි වඳුරු පැංචයි මෙහෙම කතා වෙනවා.

"පැංචෝ, කොහොමද මේ බඩු නැති වෙන්නේ කියලා අපිටම හොයලා බලන්න සිද්ධ වෙනවා. අපි අද හවස පොඩ්ඩක් ඉඳලා යමු මොකක්ද මේ වෙන්නේ කියලා බලන්න."

"ඒක හොඳ අදහස." වඳුරු පැංචා කිව්වා. හවස් වෙලා පාසල ඇරිලා හැමෝම ගෙදර ගියා. හැබැයි පුංචයි පැංචයි ටිකක් වෙලා නැවතුණා.

"පැංචෝ අපි මේ ගහට මුවාවෙලා ටිකක් බලන් ඉමු මොකක්ද මේ වෙන්නේ කියලා කියලා."

ඔහොම බොහෝ වේලා පැංචයි පුංචයි ගහට මුවාවෙලා බලන් හිටියා. වඳුරු පැංචා කියනවා, "පුංචෝ මේක නම් හරියන්නේ නෑ වගේ. අපි බෙදිලා ගිහින් හොයමු." "හරි එහෙනම් මම මේ පැත්තට යන්නම්. ඔයා අර පැත්තට යන්න මොනව හරි හම්බවුනොත්

මට සංඥාවක් එවන්න." මේ දෙන්නා බෙදිලා ගියා. ටික වෙලාවකට පස්සේ පැංචා පුංචාට සංඥා කළා.

"ආ..... ඒ ඇහෙන්නේ වඳුරු පැංචාගේ සංඥාව නේද? ඉක්මනට යන්න ඕනේ."

"ෂ්..... සද්ද කරන්න එපා. අතන ඉන්නවා හොරා." වඳුරු පැංචා කිව්වා. හා පුංචා කියනවා, "මට නම් පේන්නේ ඒ හැඩරුව හරියට... නරි පොඩ්ඩගෙ වගේ." "හැඩරුව නරි පොඩ්ඩගෙ වගේ නෙමෙයි. ඒ ඇත්තටම ඉන්නේ නරි පොඩ්ඩා." වඳුරු පැංචා කිව්වා.

"අපිට දැන්නම් මොනවත් කරන්න බෑ. මෙයා අපිව දකින්න කලින් අපි මෙහෙන් යමු" කියලා හා පුංචයි වඳුරු පැංචයි ගියා.

පසු දිනත් වෙනදා වගේම සිසුන්ගේ බඩු නැතිවෙලා තිබුණා.

"පැංචෝ, ඇයි දන්නෑ නරි පොඩ්ඩා එහෙම දෙයක් කළේ?" පුංචා ඇහුවා.

"සමහර විට... එයා හොරෙක්වත්ද?"

"සමහරවිට වෙන්න පුළුවන්. අදත් අපි හවස ඉඳලා බලමු. අදත් නරි පොඩ්ඩා බඩු හොරකම් කළොත් අපි එතනට ගිහින් එයාගෙන්ම දැන ගමු."

පාසල ඇරිලා ඊයේ වගේම පැංචයි පුංචයි හැංගිලා නරි පොඩ්ඩා දිහා බලන් හිටියා.

"බලන්නකෝ පුංචෝ... මෙයා අදත් බඩු හොරකම් කරනවා."

හා පුංචා කියනවා, "අපි එයාගේ ඉස්සරහට ගිහින් කෙලින්ම කතා කරමු."

"හා... හා... යමු." පැංචා කිව්වා.

"මම මේකත් ගන්නවා. මේ ඉස්කෝලේ ළමයි මේවා හොයනවා බලන්න මට ඉවසුමක් නෑ." නරි පොඩ්ඩා හිනා වෙවී කියනවා.

"නරි පොඩ්ඩෝ! ඇයි ඔයා මේ බඩු හොරකම් කරන්නේ?" හා පුංචා ඇහුවා.

"මො... මොන බඩුද?" නරි පොඩ්ඩා බඩු ටික අතේ හංගාගෙන කිව්වා.

"ඇයි ඔය දැන් අතේ හංගගත්තේ." වඳුරු පැංචා කිව්වා.

"මට සමාවෙන්න. මම මෙහෙම දෙයක් කළේ අර ළමයින්ට හොඳ පාඩමක් උගන්වන්න." නරි පොඩ්ඩා දුකින් කිව්වා.

"ඒත් ඇයි ඔයා ඒගොල්ලොන්ට ඔහොම වැඩක් කළේ?" හා පුංචා ඇහුවා.

"ඒක තමයි. මට තවත් ප්‍රශ්නයක් තියෙනවා. ඔයා අනිත් ළමයින්ගේ බඩු හොරකම් කරනවා. හැබැයි අපි දෙන්නගෙ බඩු හොරකම් කළේ නෑ." වඳුරු පැංචා කුතුහලෙන් ඇහුවා.

"හරි... මම ඔය දෙන්නට ඇත්තම කියන්නම්. මේකයි සිද්ධ වුනේ, මම පළවෙනියටම පාසලට ආපු දවසේ ඔය දෙන්නා විතරයි මට හොඳින් කතා කළේ. අනිත් හැම ළමයම මට විහිළු කරා. ඉතින් මම ඒගොල්ලොන්ට හොඳ පාඩමක් උගන්නන්න ඕනේ කියලා හිතුවා. ඉතින් මම ඒගොල්ලන්ගේ බඩු හොරකම් කළා." නරි පොඩ්ඩා කිව්වා.

"ඒත් නරි පොඩ්ඩෝ, එහෙම ඒ ළමයින් විහිළු කළාට ඔයා ඒගොල්ලන්ගේ බඩු හොරකම් කරන එක වැරදියි නේද?" පූංචා ඇහුවා.

"ඔව් ඒක වැරදියි. ඒත් ඒගොල්ලෝ මට විහිළු කරන එකත් වැරදියි නේද? අනේ මම මේ කරපු දේ ගැන කාටවත් කියන්න එපා." නරි පොඩ්ඩා කිව්වා.

"හරි අපි මේ ගැන කාටවත් කියන්නේ නැතුව ඉන්නම්. හැබැයි ඔයාට කොන්දේසි දෙකකට එකඟ වෙන්න පුළුවන් නම් විතරයි." හා පූංචා කිව්වා.

"මොනවද ඒ කොන්දේසි?"

"පළවෙනියටම ඔයා හොරකම් කරපු බඩු ටික ඒ තිබුන තැන්වලින්ම තියන්න ඕනේ. දෙවැනි එක, ආයෙමත් කවදාවත් ඔය වගේ

හොර වැඩ කරන්න බැහැ. එකඟයිද?" වඳුරු පැංචා ඇහුවා.

"එකඟයි. ඔයගොල්ලො මේ කරපු උදව්ව නම් කවදාවත් අමතක වෙන්නේ නෑ." නරි පොඩ්ඩා සතුටෙන් කිව්වා.

එදැයින් පස්සේ නරි පොඩ්ඩා කවදාවත් හොරකම් කළේ නෑ. අනිත් ළමයින්ගේ බඩු ටිකත් ඒගොල්ලන්ටම ලැබුණා.

ඔන්න දැන් හා පුංචයි, වඳුරු පැංචයි ඒ වගේම නරි පොඩ්ඩයි හොඳම යාලුවෝ වුණා.

# විනෝද චාරිකාව

පුංචා, පැංචා ඒ වගේම පොඩ්ඩාත් සුපුරුදු ලෙස පාසලට යන්න පිටත් වුණා.

"අද තමයි පාසලේ අන්තිම දවස. තව මාසෙකින් තමයි පාසල පටන් ගන්නේ." නරි පොඩ්ඩා සතුටින් කිව්වා.

"ඇයි තවත් සතුටු කාරණාවක් තියෙනවනේ. ඔය දෙන්නා පාසලට ආවේ ළඟදි නිසා දන්නේ නැතුව ඇති." හා පුංචා කිව්වා.

"ඒ මොකද්ද? අපිටත් කියන්නකෝ." කියලා වඳුරු පැංචා කිව්වා.

"අපි හැම නිවාඩුවකටම විනෝද චාරිකාවක් යනවා." පුංචා කිව්වා.

"අනේ ඒක කොච්චර හොඳද." පැංචයි පොඩ්ඩයි කිව්වා.

"අපි එහෙනම් ඉක්මනට පාසලට යමු." පුංචා කිව්වා.

"ළමයිනේ, අද තමයි පාසලේ නිවාඩු දෙන දවස. වෙන දවස්වල වගේම මේ සැරෙත් අපි විනෝද චාරිකාවක් යනවා." කොටි ඇදුරුතුමා කිව්වා.

"ගුරුතුමනි ගුරුතුමනි, මේ සැරේ අපි කොහේද යන්නේ?"

"අපි මේ සැරේ සත්තු වත්තකට යනවා. අපේ කැලේ නැති සත්තු බලන්නයි යන්නේ." ගුරුතුමා කිව්වා.

"මොන වගේ සත්තුද?"

"ගවයෝ, එළුවෝ, අලියෝ, දුර්ලභ කුරුලු ජාතීත් බලන්න යනවා. අද අපි පාසල කලින් ඉවර කරමු. මොකද ඔයගොල්ලන්ට ලෑස්ති වෙන්නත් තියෙනවනේ." ගුරුතුමා කිව්වා.

පාසල ඉවර වුණා. ළමයි හැමදෙනාම ඉක්මනට තම තමන්ගේ ගෙවල්වලට ගියා. පසුදින උදයේ හැම ළමයාම පාසලට ඇවිත් හිටියා.

"ඕනෑ කරන දේවල් හැම එකක්ම ගන්න ළමයිනේ. අපි එහෙට ගිහින් තව දවස් දෙකකින් තමයි එන්නේ." ගුරුතුමා කිව්වා.

"මට එහෙට යනකං ඉවසුමක් නෑ." පැංචා කිව්වා.

"තව ටිකකින් අපි යන්න පිටත් වෙනවා. ඒක නිසා දැන් පෝලිමක් හැදෙන්න." ගුරුතුමා කිව්වා.

ටික වේලාවකට පසු ගුරුතුමයි ශිෂ්‍යයොයි විනෝද චාරිකාව පිටත් වුණා. දහවල් වන විට ඒගොල්ලන්ට සත්තු වත්තට යන්න පුළුවන් වුණා.

"ඔන්න අපි ආවා. දැන් හැම ළමයම දවල් කෑම එක කන්න. ඊට පස්සේ අපිට සත්තු බලන්න යන්න පුළුවන්." ගුරුතුමා කිව්වා.

හැමදෙනාම තමන්ගේ කෑම එක කෑවා.

"ළමයිනේ, පළවෙනියටම අපි යමු එළදෙනුන්ගෙන් කිරි ලබාගන්න හැටි බලන්න." ගුරුතුමා කිව්වා.

මේ විදිහට ගුරුතුමා ළමයින්ව තැනින් තැනට අරන් ගියා. රාත්‍රිය උදා වුණා.

ගුරුතුමා කියනවා, "අදට අපි බලපු ටික ඇති. හෙට අපි අලි බලන්න යමු."


උදෙන්ම සැමදෙනාම අලි බලන්න ගියා. "බලන්නකෝ මෙතන අලි ගොඩක් ඉන්නවා." නරි පොඩ්ඩා කිව්වා. එක පාරටම එක අලියෙක් කුලප්පු වුණා. "මෙන්න අලියෙක් කුලප්පු වෙලා. දුවන්න... දුවන්න... " හැමෝම එතනින් දුවලා ගියා. "පැංචෝ, පොඩ්ඩෝ, ඇයි ඒ අලියා කුලප්පු වුණේ?" පුංචා ඇහුවා. "අපි එතනට ගිහිල්ලම බලමු." නරි පොඩ්ඩා කිව්වා.

"හා... හා... යමු." වඳුරු පැංචාත් කිව්වා. "ඒ අලියා ළඟට අපි හිමිහිට යමු. නැත්නම් ආයි එයා කුලප්පු වෙයි." පුංචා කිව්වා.

"අලි යාලුවේ, ඇයි ඔයා කලින් අර විදිහට එතන හිටපු හැමෝවම බය කළේ?" වඳුරු පැංචා ඇහුවා.

"බලන්න මගේ කකුලේ කට්ටක් ඇනුණා. ඒ නිසයි මම එතන කලබලයක් ඇති කළේ." අලි යාලුවා දුකින් කිව්වා.

"ඒක එච්චර තදට ඇනිලා නම් නෑ. අපි තුන්දෙනාට පුළුවන් ඔය කට්ට අයින් කරන්න." නරි පොඩ්ඩා කිව්වා.



"අනේ ඒක කොච්චර හොඳද. ඔයගොල්ලොන්ට මේක අයින් කරන්න පුළුවන්ද?" අලි යාලුවා ඇහුවා.

"අපි තුන්දෙනා එකට උත්සහ කළොත් අපිට පුළුවන් මේක ගලවන්න." හා පුංචා කිව්වා.

"ඔයා ලෑස්තිද?" "ඔව්.. ඔව්.."

එකායි... දෙකායි... තුනායි... අදිමු." එකපාරටම ඒ කටුව අලි යාලුවාගේ කකුලෙන් ගැලවුණා.

"ඔය තුන් දෙනාට ගොඩක් ස්තුතියි!" අලි යාලුවා කිව්වා. "ඕක සුළු දෙයක්නේ. අපි එහෙනම් යනවා." හා පුංචා කිව්වා.

"ගුරුතුමනි, අර අලියා කුලප්පු වෙලා තියෙන්නේ එයාගේ කකුලේ කට්ටක් ඇනුණු නිසා." හා පුංචා කිව්වා.

"ඔව් ගුරුතුමනි, අපි තුන්දෙනා එකතු වෙලා ඒ කට්ට ගැලෙව්වා." වඳුරු පැංචා කිව්වා.

"ඔයගොල්ලෝ ගැන මට හරිම ආඩම්බරයි. ඔය තුන්දෙනා එකතු වෙලා කළේ ගොඩක් හොඳ වැඩක්." ගුරුතුමා සතුටින් කිව්වා.

"ගුරුතුමනි, දැන් අපිට  අලි බලන්න යන්න පුළුවන් නේද?" නරි පොඩ්ඩා ඇහුවා.

"මොකෝ බැරි?"

එහෙම කියලා ගුරුතුමා ළමයින්වත් එක්කගෙන අලි බලන්න ගියා. ඊට පස්සේ අනිත් සත්තුත් බලන්න ගියා.

ඊළඟ දවසේ ගුරුතුමා මෙහෙම කියනවා, "ළමයිනේ අද තමයි අන්තිම දවස. අද අපි දුර්ලභ කුරුලු ජාති බලන්න යනවා."

ඉතින් මේ හැමෝම දුර්ලභ කුරුලු ජාති බලන්න ගියා.

හවස් වුණාට පස්සේ ඔවුන් ආපහු ගෙදර යන්න පිටත් වුණා.

රෑ වෙනකොට හැමෝම ගෙදර ගියා.

"සුභ ගමන්. අපි ආපහු ඊළඟ මාසෙදි හම්බවෙමු." හා පුංචා කිව්වා.

"ඔය හැමෝටම සුභ ගමන්!

-නිමි-



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසලේ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනය ඵලදායිතාව වෙනුවෙන් වසර වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමව්පියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්